## සමෘද්ධිය පරිසර ආරක්ෂණ අධිකාරිය

### 1 මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සමෘද්ධිය පරිසර ආරක්ෂණ අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට සමෘද්ධිය පරිසර ආරක්ෂණ අධිකාරියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 ගණුම්කරණ අඩුපාඩු

(i) ශ්‍රී .ල.ගි.ප්‍ර 03 අනුව නඩු තීන්දුවකින් ලැබී තිබූ රු.මිලියන 15.6 ක දඩමුදල පිළිබඳව සටහන් මගින් ගිණුම් වල හෙළිදරව් කර නොතිබූ අතර රු. මිලියන 11.6 ක් සමෘද්ධිය පරිසර ආරක්ෂණ අරමුදලටද රු. මිලියන 4 ක් සේවක ආපදා අරමුදලකටද බැර කර තිබුණි.

(ii) ශ්‍රී .ල.ගි.ප්‍ර 18 අනුව වත්කම් ක්ෂය කිරීම අදාල වත්කම් භාවිතය සඳහා යෝග්‍ය වූ අවස්ථාවේ සිට ආරම්භ කළ යුතු වුවද, අධිකාරිය විසින් රු: 8,021,851 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.

##### 1.2.2 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------
පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| (i) | 5.2.5 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාල අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද අවසාන අයවැය ලේඛණය අදාල වර්ෂය ආරම්භ කිරීමට දින 15 කට පෙර අදාල අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අයවැය ලේඛණය 2011 ජනවාරි මස ඉදිරිපත් කර තිබුණි. |
| (ii) | 6.5.3 වගන්තිය | 2009 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (iii) | 7:4:1 වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට අවම වශයෙන් එක බැගින් වර්ෂයකට රැස්වීම් 4 ක් පැවැත්විය යුතු වුවත් 2010 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 1 ක් පමණක් පවත්වා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය සමාලෝචනය

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.45,870 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. 1,809,829 ක් වූ අතිරික්තය සමග සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,855,699 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

### 2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල අදායම රු: 4,286,157 කින් වැඩි වුවද, වැටුප් හා සේවක වියදම් රු. 1,157,076ක්ද, අනෙකුත් අයහාර වියදම් රු. 1,735,776 ක්ද, ප්‍රදාන හා අනෙකුත් මාරු වියදම් රු. 3,249,004 ක ද වැඩි වීම නිසා මුළු වියදම රු. 6,141,856 කින් වැඩි වීම ඉහත අවාසිදායක විචලනයට හේතු වී තිබුණි.

(ආ) පෙර වර්ෂය හා සාපේක්ෂව සංසන්දනය කර බැලීමේදී අධිකාරියේ ජංගම වත්කම් රු: මිලියන 16.2 කින් ජංගම නොවන බැරකම් රු: මිලියන 16.3 කින් වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. එම වැඩිවීම පිළිවෙලින් 276% ක් හා 373% ක් විය. මීට ප්‍රධාන වශයෙන් බලපෑ හේතුව ලෙස සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ දඩමුදල් ආයෝජනය කිරීම බව නිරීක්ෂණය විය.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කාර්ය සාධනය

අධිකාරිය විසින් භෞතික කාර්ය සාධනය 2010 වර්ෂය තුලදී කාලච්ඡේද වලට අනුකූලව ඇගයීමට ලක් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂයේ එක් එක් ක්‍රියාකාරකමට වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල ඉක්මවා ක්‍රියාකාරකම් 9 ක් සඳහා රු: 3,868,640 ක් හෙවත් 45.68 % මුදලක් වියදම් කර තිබුණි.

(ආ) වර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලින් ක්‍රියාකාරකම් 3 ක මුළු ප්‍රතිපාදන මුදලද තවත් ක්‍රියාකාරකම් 4 ක ප්‍රතිපාදන මුදලින් 70% ක් හෝ ඊට වඩා වැඩි මුදලක්ද ඉතිරි වී තිබුණි.

### 2.2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ ආදායම රු. මිලියන 4.8 ක් වූ අතර එය මුළු ආදායමෙන් 9% කි. රජයේ ආධාර රු. මිලියන 48.1 ක්වූ අතර එය මුළු ආදායමෙන් 91% කි. මුළු ආදායමින් පුනරාවර්තන වියදම් සඳහා 79% ක් හෙවත් රු. මිලියන 42 ක් වැයකර තිබූ අතර රු.මිලියන 11 ක් එනම් මුළු ආදායමින් 21% ක් පමණක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රාග්ධන වැය සඳහා යොදාගෙන තිබුණි.

### 2.2.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

සමුද්‍ර දූෂණය කිරීමට එරෙහිව එම්ටි ග්‍රැන්බා නෞකාවට (Mt Granba incident) එරෙහිව තිබූ නඩුවෙන් දඩ මුදල් ලෙස 2010 ජූනි 11 දින තුල ලැබී තිබූ මුදලින් රු. මිලියන 10 ක මුදලක් 2010 නොවැම්බර් 11 දින දක්වා ජංගම ගිණුමක මාස 05 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

### 2.2.4 කාර්ය මණ්ඩල පිරිවැය

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| සමාන්‍යාධිකාරී | 01 | 01 | - |
| සහකාර කළමනාකරු මෙහෙයුම් | 01 | 01 | - |
| සහකාර කළමනාකරු (පලාත්) | 03 | 02 | 01 |
| කළමනාකරු | 03 | 03 | - |
| සහකාර කළමනාකරු | 10 | 10 | - |
| සමුද්‍ර පරිසර නිළධාරී | 11 | 06 | 05 |
| සමුද්‍ර පරිසර සහකාර | 12 | 04 | 08 |
| සමුද්‍ර දූෂණය වැළැක්වීමේ ක්ෂේත්‍ර සහකාර | 64 | 47 | 17 |
| රියදුරු | 06 | 05 | 01 |
| උදව්කරු | 09 | 07 | 02 |
| | 120 | 86 | 34 |

2010 දෙසැම්බර් 31 දිනට අධිකාරයේ අනුමත කාර්ය මණ්ඩලය ඉහත දක්වා ඇති පරිදි 120 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 86 ක් විය. තනතුරු 34 ක පුරප්පාඩු පැවතියද එම පුරප්පාඩු පිරවීමට අධිකාරය විසින් කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** 2008 නොවැම්බර් 24 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්එස්/ඊ2/58/5/375/2 ලිපියෙහි පරිදි 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා අංක 30 චක්‍රලේඛයෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අනුමත කළ තනතුරු 16 ක් 2008 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කළ යුතුය යනුවෙන් සඳහන් කර අනුමැතිය ලබාදී තිබුණද විගණිත දිනය වන විටත් එම තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** අධිකාරයේ අභ්‍යන්තර විගණක තනතුර දරන්නේ කළමනාකාර සහකාර ශ්‍රේණියේ නිළධාරියකු වන අතර අභ්‍යන්තර විගණක තනතුරේ පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ)** සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය වෙරළ සහ සමුද්‍ර පරිසර ආරක්ෂණ කටයුතු හම්බන්තොට සිට පුත්තලම දක්වා බටහිර වෙරළ තීරයේ ක්‍රියාත්මක වන අතර එම ප්‍රදේශය කලාප 07 කට වෙන්කර එම කලාප වලට අයත් ප්‍රදේශවල කටයුතු ප්‍රාදේශීය කාර්යාල මගින් ඉටුකරනු ලැබේ.

කලාප කාර්යාල සඳහා මානව සම්පත් යෙදවීම් පිළිබඳ විගණනයේදී පහත කරුණු අනාවරණය විය.

(i) ගාල්ල සහ කළුතර කාර්යාල දෙක සඳහා පමණක් කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකු අනුයුක්ත කර ඇති අතර එම නිළධාරීන්ට එම කුඩා ප්‍රාදේශීය කාර්යයාල වල කිරීමට ඇති රාජකාරියේ ස්වභාවය විගණනයේදී පැහැදිලි නොවීය.

(ii) මේ අනුව එක් එක් ප්‍රාදේශීය කාර්යාල සඳහා නිලධාරීන් අනුයුක්ත කළයුතු ආකාරය පිළිබඳ නිවැරැදිව සැකසූ වැඩ පළිවෙලක් නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.2.5 සංයුක්ත සැලැස්ම

2008-2013 දක්වා කාලපරිච්ඡේදය සඳහා සකස් කරන ලද සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි. 2003 ජුනි 03 දින හා අංක පීඊඩී 12 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5.1.3 ජේදයේ ප්‍රකාරව 2010 වර්ෂය සඳහා යාවත් කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන්හි අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) බඳවා ගැනීම් හා කාර්ය මණ්ඩල පිරිවැය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) අයවැය
(ඉ) වත්කම්
(ඊ) අත්තිකාරම් පියවීම්